''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
**Online ISSN: 2394-6792**
**http://fhss.sjp.ac.lk/pumithiri-journal/**
**වෙළුම: 2; I කලාපය; 2023 මාර්තු; පිටු: 51-59**

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ කාන්තාව

**ඩී. දිලිනි නිමේෂිකා**
සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
dndombagodage8062@gmail.com

**සංක්ෂේපය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු පුරුෂයන්ගේ සහ ස්ත්‍රීන්ගේ හැසිරීම හා ක්‍රියාවන් තීරණය කරන සමාජීයව ගොඩනගන ලද සම්මතයන් හා මතවාදයක් ලෙස අර්ථකථනය කළ හැකිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ස්ත්‍රිය හා පුරුෂයාට සමතැන තිබේද යන්න ප්‍රශ්නාර්ථයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය තුළ ස්ත්‍රියට හා පුරුෂයාට වෙන්වූ භූමිකාවක් පවතින බව දැකගත හැකිය. ලිංග භේදය මත පදනම්ව පුරුෂයා ශාරීරිකව හා මානසිකව ශක්තිමත්, එඩිතර, නායකත්ව ලක්ෂණ ඇති හා විචක්ෂණශීලී බුද්ධියෙන් යුත් පුද්ගල කොට්ඨාශයක් ලෙසත් ස්ත්‍රීන් ළඳ බොළඳ, සුන්දර, පුරුෂයන් මත යැපෙන, තම ආරක්ෂාව සමන්ට සපයා ගත නොහැකි, ඉක්මණින් සසල වන සිතක් ඇති තැනැත්තියක ලෙස සමාජය වර්ගීකරණයට ලක්කොට ඇත. මෙම වර්ගීකරණය මත පදනම්ව ස්ත්‍රිය හා පුරුෂයාට වෙන්වූ කාර්යභාරයක් තිබෙනු දැකගත හැකිය. ඒ අනුව පුරුෂයාට මූල්‍යමය බලතලත් ස්ත්‍රියට දරුවන් හදාවඩා ගනිමින් නිවසේ සෑම කටයුත්තක්ම කිරීමේ වගකීමත් පැවරී ඇත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය තුළ ස්ත්‍රිය අධ්‍යාපන, දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික සන්දර්භය තුළ හැසිරෙනුයේ කුමනාකාරයෙන්ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණ වාර්තාවේ ප්‍රධාන අරමුණ විය. මෙකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පොත්පත්, සඟරා, පර්යේෂණ වාර්තා වැනි ද්විතීක මූලාශ්‍ර පරිශීලනය කරන ලදි. එම මූලාශ්‍ර පරිශීලනයෙන් සමස්තයක් ලෙස තහවුරු වූයේ සමාජය කොතරම් දියුණු වුවද ස්ත්‍රිය හා පුරුෂයා මත පැවරුණු කාර්යභාරයෙහි පැහැදිලි වෙනසක් තවමත් සිදුව නොමැති බවයි. තවමත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය තුළ කාන්තාව වින්දිතභාවයට පත්වන ආකාරය වර්තමානය තුළත් දැකගත හැකිය. ලිංගිකත්වය මත පදනම්ව ස්ත්‍රිය හා පුරුෂයා මත වෙනස් කොට සැලකීම සමාජයෙන් වහ වහා තුරන් විය යුතු අතර පුරුෂයා හා සම වරප්‍රසාද කාන්තාවටද හිමිවිය යුතු බව මෙම ලිපියේ යෝජනා අතර වේ.

**මුඛ්‍ය පද:** කාන්තාව, ලිංගිකත්වය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හැඳින්වීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයෙක් පිරිමියෙක්ද ගැහැනියක්ද යන වගයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ වැඩි වශයෙන් කතාබහට ලක් වන පාර්ශවය වශයෙන් කාන්තාව හඳුනාගත හැකිය. මන්ද පවතින සමාජ ක්‍රමය තුළ පුරුෂයා වීරයෙකු ලෙස පෙන්වා දෙමින් කාන්තාවගේ රැකවරණය හා ආරක්ෂාව සපයන්නා වූ මෙන්ම දැඩි පෞරුෂයකින් යුත් චරිතයක් ලෙසට අතීතයේ සිටම පවත්නා සමාජ ක්‍රමය තුළ පුරුෂයා මත ආරෝපණය කර තිබීමයි. මෙම පදනම මත පිහිටා පුරුෂයා සහ කාන්තාව යන පාර්ශවයන් කෙරෙහි වෙන වෙනම මතවාද ගොඩනැගී ඇති බව හඳුනාගත හැකිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය ගොඩනැගීමෙහිලා ද සමාජය තුළ මුල් බැසගත් මෙම මතවාදය හේතු වී ඇති බව හඳුනාගත හැකිය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය නැමැති සංකල්පය සාකච්ඡා කරන විට හුදෙක් යම් පිරිස් එය ලිංගිකත්වය යැයි ප්‍රකාශ කරති. ලිංගිකත්වය වනාහී ජීව විද්‍යාත්මක තත්ත්වයක් වන අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු සංස්කෘතිකමය තත්ත්වයකි. සමාජවිද්‍යාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතීතයේ සිටම සාකච්ඡාවට ලක්ව ඇති නව සංකල්පයක් වශයෙන් හැඳින්විය හැකිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය කෙරෙහි අවධානය යොමු කිරීමේදී ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති අර්ථකථනයන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අර්ථ දක්වනුයේ "සංජානනමය හා ද්‍රව්‍යමය වශයෙන් පුරුෂයින් හා ස්ත්‍රීන් අතර සම්බන්ධතාවය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ලෙසයි. ස්ත්‍රී පුරුෂභාවය ස්ත්‍රී පුරුෂ

දෙපාර්ශවයේම ලිංගික ලක්ෂණ වල ප්‍රතිඵලයක් ලෙස ජීව විද්‍යාත්මකව නීර්ණය නොවන නමුත් එය ගොඩනැගෙන්නේ සමාජීය වශයෙනි. එය බොහෝවිට නිෂ්පාදනය හා ප්‍රජනනය, පාරිභෝජනය හා බෙදා හැරීම යන ක්‍රියාවලිය පාලනය කරයි" (ආහාර හා කෘෂිකර්ම සංවිධානය , 1997). එසේම තවත් තැනක ස්ත්‍රීන් හා පුරුෂයන් එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ, අනන්‍යතා, හැසිරීම් රටා, භූමිකා හා වෘත්තීන් සමාජය විසින් නිර්මාණය කර ඇති අතර ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පවරා දී ඇති එම සමාජ සංස්කෘතික තත්ත්වය ස්ත්‍රී පුරුෂ සමාජභාවය වශයෙන් අර්ථකථනය කර ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදයේ මුල්වරට භාවිතා කොට ඇත්තේ මනෝ වෛද්‍ය විද්‍යාව තුළයි. Robert Stollen 1968දී කළ මනෝ විශ්ලේෂණවාදය පිළිබඳ අධ්‍යනයේ දී 'Gender' යන පදය ස්ත්‍රී පුරුෂ විභේදනය ගැන නොසලකා මානව හැසිරීම විශ්ලේෂණය කිරීමට භාවිත කොට තිබේ (liyanage & walakuluge, 2006). එහෙත් නූතන අර්ථයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදය ඉතා පුළුල්ව භාවිතා කොට ඇත්තේ ස්ත්‍රීවාදීන් විසිනි. 1970 සහ 1980 යන දශකවල සම්භාව්‍ය ස්ත්‍රීවාදී අර්ථකථනයන් තුළ වර්තමාන අදහසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන පදය භාවිත කොට ඇත. අනතුරුව ස්ත්‍රීවාදීන් විසින් සිය සමාජ දේශපාලන විග්‍රහයන් හිදී ස්ත්‍රිය අප්‍රධාන තත්වයට පත් කොට ඇති මෙම සමාජ නිර්මිතය පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටියක් ගොඩනගනු ලැබීය. ඒ අනුව වර්තමානය වන විට ලොව පුරා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් පුළුල් කතිකාවන් ආරම්භ වී ඇති අතර ඒ තුළ කාන්තාවන් පීඩාවට ලක්වන ආකාරය කෙරෙහි වැඩි අවධානයක් යොමුව ඇත.

**අතීත සමාජයට සාපේක්ෂව නූතන සමාජය තුළ කාන්තාවගේ භූමිකාව තුළ සිදුව ඇති වෙනස**

ඈත අතීතයේ සිට ස්ත්‍රිය හා පුරුෂයා අතර වෙනස් සමාජ තත්ත්වයන් හා භූමිකා නිර්මාණය වී ඇත. එදා විස්තෘත පවුල් ඒකකයන් තුළ පිරිමි දරුවා සිය පියා යටතේ කාර්යභාරයන් හා භූමිකා ආරෝපණය කරගනිමින් සමාජගත වෙද්දී ගැහැණු දරුවා සිය මව යටතේ තම කාර්යය භාරයන් හා භූමිකා ආරෝපණය කර ගනිමින් සමාජගත විය. ඒ අනුව දරුවන් සමාජානුයෝජනය වන පවුල තුළින්ම ඔවුන් හුරු කරන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය මත පිහිටා බව මේ අනුව ගම්‍ය වේ. මෙම සමාජ තත්වය තුළ ස්ත්‍රියට වඩා පුරුෂයාට ප්‍රධාන තැනක් හිමිකර දෙමින් සෑම සමාජයක් තුළම පුරුෂාධිපත්‍ය යන සංකල්පය ද ප්‍රමුඛ වී ඇත. එසේම ජාතිය, ආගම, කුලය, පන්ති හරහා ද කාන්තාවට පහළ තත්ත්වයක් හිමි විය. බ්‍රාහ්මණ සමාජය තුළ කාන්තාව කෙරෙහි මෙකී සමාජ තත්ත්වය පැහැදිලිවම දැකගත හැකි විය. එදා සමාජයේ කාන්තාවට කිසිදු ස්වාධීනත්වයක් හිමි නොවූ අතර සෑමවිටම පුරුෂාධිපත්‍යයට යටත්ව ජීවිතය පවත්වාගෙන යාමට සිදුවිය. ඒ බව මනුස්මෘතියේ මෙසේ දැක්වේ.

"බාලෙ‍්‍යා පීතුර්වසේ නිෂ්යේත්
පාතිඃ ග්‍රහස්‍ය යෞවනේ
පුත්‍ර තානං භාර්තනී ප්‍රේතේ
නභජේත් ස්ත්‍රී ස්වාතන්ත්‍රතාම්"

ඒ අනුව කාන්තාව කුඩා කාලයේදී සිය පියා යටතේ ද තරුණ කාලයේ දී සිය ස්වාමි පුරුෂයා යටතේද මහලු කාලයේ දී සිය වැඩිමහල් පුතා යටතේද ජීවත් විය යුතුය. ඒ අනුව උපතේ සිට මරණය දක්වාම කාන්තාව පුරුෂාධිපත්‍යය යටතේ ජීවත් වීම අතීත සමාජය තුළ සමාජ නියමයක් විය. එමෙන්ම ඓතිහාසික සන්දර්භය විමසා බලන කල්හි කාන්තාවට හිමි වූ පහත් සමාජ තත්ත්වය පිළිබඳ සාක්ෂි හමුවේ. ඒ අනුව ග්‍රීක දාර්ශනික සොක්‍රටීස් දක්වනුයේ කාන්තාවන් සිටීම ලොව පරිහානියට ප්‍රබල හේතු කාරකයක් වන බවයි. තවදුරටත් ඔහු ප්‍රකාශ කොට ඇත්තේ "කාන්තාව යනු විෂ ගසකට සමානය. එම ගසේ බාහිර ස්වරූපය අලංකාරය. නමුත් එහි ඵලය බට්ටිත්තන් කෑ විගසම එම බට්ටිත්තන් මිය දෙති" යනුවෙනි. එසේම වේද සාහිත්‍යයට අනුව "කාන්තාව යනු සියලු විෂ කලතා තැනූ මායාව නැමැති කරඬුවකි". එසේම රෝම සංස්කෘතියට අනුව කාන්තාව පණ නැති වස්තුවක් බවට අර්ථකථනය කර ඇත. ඉන්දියානු සංස්කෘතියට අනුව ස්වාමියා මියගිය විට ස්වාමියා දැවෙන දර සෑයට පැන ජීවිතය කැප කළ යුතුය. එය සති පූජාව නමින් හැඳින්විය. එමෙන්ම චීන ජාතිකයන් කාන්තාව ධනයත් භාග්‍යයත් අහිමි කරවන දුර්භාග්‍යයමත් කොට්ටාසයක් ලෙසින් සලකා ඇත. අතීත චීන රජය විසින් චීන ජාතිකයන්ට කාන්තාවන් පණපිටින් වළලා දැමීමේ අයිතිය හිමිකර දී තිබිණි. මේ ආකාරයට අතීත සමාජය තුළ කාන්තාව තිරිසන් සතෙකුගේ තත්ත්වයට ඇද දමමින් පීඩාවට පත්කොට ඇති බව හඳුනාගත හැකිය.

අතීත සමාජයේ පවුල් සංස්ථාව තුළද කාන්තාවට හා පිරිමියාට වෙන් වූ නිශ්චිත කාර්යභාරයක් හඳුනාගත හැකිය. ඒ අනුව කාන්තාව දරුවන් හදා වඩා ගනිමින් ඉවුම් පිහුම් ආදී නිවසේ කටයුතු සිදු කරද්දී පුරුෂ පාර්ශවය දඩයම් කිරීම, මසුන් ඇල්ලීම, දර එකතු

කිරීම වැනි කාර්යයන්වල නිරත විය. නමුත් සමාජ විකාශනයත් සමගම පුරුෂයින් ගොවිතැන් කිරීම, අධ්‍යාපනය ලැබීම ආදී කාර්යයන් වලද නියැලිනි. නමුත් කාන්තාවන්ගේ කාර්යභාරයන්වල වෙනසක් සිදුවනු දක්නට නොලැබීය. එමගින් පැහැදිලි වන්නේ කාන්තාව නිවස ආශ්‍රිත කාර්යයන්වල නිරත වෙමින් ඒකාකාරී ජීවන රටාවක් මත වගකීම් ඉටු කිරීමත් පිරිමි පාර්ශවය ආර්ථික හිමිකාරිත්වයත් දරන බවත්ය. එමෙන්ම ප්‍රජනන කාර්යයට යෝග්‍ය අයුරින් නම්‍යශීලී සිරුරක් සහිතව ස්ත්‍රිය නිර්මාණය වී ඇති බැවින් ඇය පුරුෂයාට වඩා දුර්වල නම්‍යශීලී අයෙකු ලෙස සමාජය තුළ සැලකේ. එයට සාපේක්ෂව පුරුෂයා සතු දැඩි මාංශපේෂි හා වෙනත් ශාරීරික ලක්ෂණ නිසා ඔහු ශක්තිමත්, එඩිතර, නිර්භීත අයෙකු ලෙස සලකනු ලැබේ. මෙම තත්ත්වයද ස්ත්‍රියට වඩා පුරුෂයා උසස්ය යන සමාජ තත්ත්වය නිර්මාණය වීමෙහිලා හේතු වී ඇත.

නමුත් සමාජ විකාශනයත් සමගම නූතන සමාජයන් තුළ මෙකී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මුල්කොටගත් පුරුෂයාගේ හා ස්ත්‍රියකගේ භූමිකාව යම් සමානකමකට ගැටෙමින් පවතී. කාන්තාව මුල් කාලීනව පැවති ඒකාකාරී ජීවන රටාව තුළින් ඔබ්බට ගොස් ගෘහ පාලනය, දරුවන් බිහි කිරීම, හදාවඩා ගැනීම යන කාර්යයන් වලට අමතරව අධ්‍යාපනය ලැබීම, වෘත්තීන්වල නියැලීම ආදී පුරුෂයා කරන කාර්යන් වල කාන්තාවද නියැලෙනු දැකගත හැකි වේ. ඒ අනුව සමාජය තුළ ආර්ථිකයේ හිමිකාරිත්වය පුරුෂ පාර්ශවය මෙන්ම ස්ත්‍රී පාර්ශවයද දරනු දක්නට ලැබේ. කෙසේ වුවද සමාජ විකාශනයත් සමග කාන්තාවගේ කාර්යභාරය විකාශනය වූවද එය සෑම සමාජයකම, සෑම සංස්කෘතියකම කාන්තාවට හිමිවේද යන්න උගහටය. ඊට හේතු වන්නේ කාලයත් සමග සමාජය විකාශනය වුවත් තවමත් පැරණි සමාජයේ සාරධර්ම, සංස්කෘතීන්, මතවාද, චාරිත්‍ර වාරිත්‍ර, අදහස් හා සිතුම් පැතුම් නූතන සමාජ ක්‍රමයත් සමග මිශ්‍ර වී පැවතීමයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යටතේ කාන්තාවට හා පුරුෂයින්ට වෙන් වූ කාර්ය භාරයක් හා භූමිකාවන් හිමි කර දෙමින් සමාජ විෂමතාවක් නිර්මාණය කර ඇත්තේ ගැමි සමාජය තුළයි. ගෝලීයකරණයත් සමග සමාජය දියුණු වුවත් එකී ගැමි සමාජයේ පවතින්නා වූ මතවාද නිසා තවමත් කාන්තාවට පුරුෂයාට සාපේක්ෂව හිමි වන්නේ අඩු තත්ත්වයකි. දරුවෙකු කුඩා කල සිට සමාජානුයෝජනය වීමේ ප්‍රථම අදියර තබන්නේ තම පවුල තුළයි. පවුල තුළ ප්‍රධාන වන්නේ පියායි. පිතෘ මූලික සමාජ ක්‍රමය තුළ කාන්තාවට වඩා පුරුෂයාට නිදහස් භූමිකාවක් ලබා දී ඇත. මව සැමවිටම නිවසේ කටයුතු සිදු කරමින් කාලය ගත කරන අතරතුර දී ගැහැනු දරුවන් තම මවට ආහාර පිසීමට, නිවසේ කටයුතු සිදු කිරීමට සහය වෙමින් නිවසට වී කාලය ගත කිරීමට සිදුවන අතර පිරිමි දරුවෙකු සෑම විටම පියා සමග ගැටෙමින් නිවසින් බැහැරව කාලය ගත කිරීමට ඉඩ සලසා දී ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ කාන්තාවට හිමිවන්නේ නිවස තුළ මෙහෙකාරියගේ භූමිකාව බවයි. වර්තමානය තුළත් කාන්තාව රැකියා කටයුතු වල නියැලුනත් නිවසේ සෑම කුඩු මහත් කටයුත්තක්ම කාන්තාව විසින් කළ යුතුය යන සමාජ පිළිගැනීමක් පවතින අතර ඉන් මිදීමට අදටත් දියුණු සමාජ ක්‍රමයක් ගොඩනැගී නැත.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පැවති කාන්තා භූමිකාව වෙනස් කිරීමෙහිලා තාක්ෂණික විප්ලවීය බලපෑම**

අතීත සරල සමාජයන් තුළ කාන්තාව ගෘහය ආශ්‍රිත විවිධ කාර්යයන්වල නිරත වෙමින් ජීවත් විය. එදා සමාජයේ කාන්තාවන්ට ස්වාධීනත්වය හිමි නොවීය. පුරුෂ පාර්ශවයේ ඕනෑ එපාකම් ඉටු කරමින් මෙහෙකාරියකගේ කාර්ය එදා කාන්තාවට නියම විය. නමුත් සමාජය ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණත්වයට පත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවට හිමි වූ එම සමාජ තත්ත්වයෙහි ගතිකත්වයක් සිදුවනු දැකගත හැකි විය. සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාකාරී තත්ත්වයන්ගෙන් ඔවුන් මුදවාලීමේ අපේක්ෂාවෙන් විවිධාකාරයේ නීති රෙගුලාසි පවා ස්ථාපිත වන සමාජ පසුබිමක් නිර්මාණය විය. විශේෂයෙන්ම 1979දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතිකරගත් ස්ත්‍රීන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ පස්වන වගන්තිය යටතේ කාන්තාවන්ට එරෙහිව පවතින දුර්මත හා අදහස් අහෝසි කිරීමේ වැදගත්කම පෙන්වා දී ඇත. මෙතැන් පටන් කාන්තාවන්ට සමාජය තුළ යම් සමාජ පිළිගැනීමක් හිමි වන්නට විය.

සරල සමාජයන් තුළ පැවති සාම්ප්‍රදායික ගති ලක්ෂණ කාර්මීකරණයත්, නාගරීකරණයත්, විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමගම සමාජයෙන් ඉවත්විය. ඒත් සමගම පුද්ගල ආකල්පයන්ගේ ද පැහැදිලි වෙනසක් දක්නට ලැබීය. එකිනෙකා තුළ පෞද්ගලිකත්වය, තරගකාරිත්වය, ආත්මාර්ථකාමී හැඟීම් උද්දීපනය වන්නට විය. මෙකී පදනම මත එකිනෙකා හඹා යාමේ අවශ්‍යතාවය පැන නැගුණු අතර ඒ සඳහා පුරුෂ පාර්ශවය පමණක් නොව ස්ත්‍රී පාර්ශවයද රැකියා ක්ෂේත්‍රයෙහි නියැලෙමින් ආර්ථිකය ශක්තිමත් කිරීමට උර දිය යුතුය යන සමාජ

පිළිගැනීම ගොඩනැගෙන්නට විය. ඒ අනුව පුරුෂ පාර්ශවය නියැලෙන සෑම ක්ෂේත්‍රයක් තුළටම ඇතුළත් වීමේ අයිතිය ස්ත්‍රී පාර්ශවයටද හිමි විය. විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමඟ ගොඩනැගුණු දියුණු රැකියා ක්ෂේත්‍රයන් තුළ ස්ත්‍රීන්ටද ඉල්ලුම ඇති විය. අද වන විට කාන්තාවන් නොමැති ක්ෂේත්‍රයන් දක්නට නොමැති තරම්ය. කෙසේ නමුත් තාක්ෂණයේ දියුණුව කාන්තාවන් කෙරෙහි ධනාත්මක මෙන්ම ඍණාත්මක ලෙස ද බලපෑම් ඇති කරන්නට විය.

තාක්ෂණයේ දියුණුවත් සමගම ලෝකය පුරා පුළුල් රැකියා වෙළඳපොළක් නිර්මාණය විය. මේ තත්ත්වය මත දැනුම පදනම් කරගෙන ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව විවිධ ක්ෂේත්‍රයන් තුළ රැකියා අවස්ථාවන් නිර්මාණය විය. ඒ අනුව රාජ්‍ය, පෞද්ගලික, ස්වේච්ඡා සංවිධාන, බහු ජාතික සමාගම් ආදී විවිධ ක්ෂේත්‍රයන් තුළ කාන්තා නියෝජනයන් දක්නට ලැබීය. තාක්ෂණයේ දියුණුවත් සමග අද වන විට කාන්තාවන් අතිශය කාර්ය බහුල වී ඇත. නිවසේ වැඩ කටයුතු කරන අතරම ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා විවිධ රැකියාවන්වල නියැලෙන කාන්තාවෝ වත්මන් සමාජයේ සුලභය. ඒ අනුව ඇතැම් කාන්තාවෝ ආයතනගතව රැකියාවන්වල නිරත වෙද්දී තවත් සමහරෙක් නිවසටම වී විවිධ සුළු පරිමාණ ව්‍යාපාර කටයුතු වල නියැලෙනු දැකගත හැකිය. ඒ අනුව නිවස ආශ්‍රිතව මල් පැල ව්‍යාපාර, බිම් මල් ව්‍යාපාර, ඇඳුම් මැසීම, රස කැවිලි ව්‍යාපාර, එළවළු වගා කිරීම, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය, පන් ආශ්‍රිත නිෂ්පාදන, සිල්ලර බඩු වෙළඳාම ආදී රැකියා අවස්ථාවන්හි නියැලෙමින් ජාතික ආර්ථිකයට යම් දායකත්වයක් සපයනු දැකගත හැකිවේ.

මීට අමතරව තාක්ෂණයේ දියුණුව කාන්තාවන් කෙරෙහි ඇති කළ වෙනස පිළිබඳව විමසා බැලීමේදී පැහැදිලිවම දැකගත හැකි තත්ත්වයක් වශයෙන් කාන්තාවන් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඉහළ නියෝජනයක් නිරූපණය කිරීම පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම අතීත සමාජයේ කාන්තාවන් හට අධ්‍යාපන අයිතිය අහිමි කර දමා තිබුණ ද තාක්ෂණයේ දියුණුවත් සමඟම බාහිර පුද්ගලයෙකුගේ මගපෙන්වීමකින් තොරව තාක්ෂණය ඔස්සේ ස්වයංව දැනුම පුළුල් කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාව විවෘත විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අද වන විට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය පිරිමින්ට සාපේක්ෂව ඉහළ නියෝජනයක් දක්නට ලැබේ. එපමණක් නොව රැකියා ක්ෂේත්‍රය ගත්කල ඒ තුළ ද පිරිමින්ට වඩා කාන්තා නියෝජනය බහුලව දක්නට ලැබේ. කාලාන්තරයක් තිස්සේ පුරුෂ පාර්ශවයට පමණක් සීමාව පැවැති විවිධ ක්ෂේත්‍රයන්හි නියැලීමේ හැකියාව විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුවත් සමග කාන්තාවන්ට ද හිමි විය.

උදාහරණයක් වශයෙන් ගුවන් නියමුවන් වශයෙන් කටයුතු කරනු ලැබුවේ පිරිමි පාර්ශවය පමණි. නමුත් අදවන විට ලොව පුරා ගුවන් නියමුවරියන් සිටිනු දක්නට ලැබේ. එම ගුවන් නියමුවරියන් අතලොස්ස අතරට 2021 වර්ෂයේදී ලංකාවේ ළාබාලතම ගුවන් නියමුවරිය බවට පත් වීමට දාහත් හැවිරිදි සත්නාරා ප්‍රනාන්දු සමත් විය. එසේම පුරුෂ පාර්ශවයට පමණක් වෙන්වූ ධීවර කටයුතු හා මල්ශාලා පවත්වාගෙන යන කාන්තාවෝද වර්තමානයේ දැකගත හැකිය. එසේම අදවන විට ලොව පුරා වෛද්‍යවරියන්, ඉංජිනේරුවරියක්, තාක්ෂණික විද්‍යාඥවරියක, පර්යේෂිකාවන්, දක්ෂ ක්‍රීඩිකාවන්, ලේඛිකාවන්, ගුරුවරියන්, රංගන ශිල්පිනියන්, ගායිකාවන්, නිවේදිකාවන්, නර්තන ශිල්පිනියන් යනාදීන් සුලභව දක්නට ලැබෙනුයේ තාක්ෂණයේ දියුණුව සමග ඇති කළ චින්තන විප්ලවය හේතුකොට ගෙනය.

තාක්ෂණයේ දියුණුව කාන්තාවන් කෙරෙහි ධනාත්මක ආකාරයට බලපෑවා සේම ඊට සාපේක්ෂව ඍණාත්මක බලපෑම් ද කාන්තාවන් කෙරෙහි ඇති කරන්නට විය. කාන්තාව වනාහි අපූර්ව නිර්මාණයකි. ලෝකයේ සුන්දරම වස්තුව කුමක්දැයි කවුරුන් හෝ විමසුවහොත් බොහෝ දෙනෙකුගේ පිළිතුර වන්නේ ගැහැනිය යන්නයි. පියවි ලෝකයේ දී කාන්තාවන් දැකීමෙන් පමණක් නොව අචේතනිකව කාන්තාවන් දැකීමෙන් පවා මිනිසාගේ සිත පිනා යන්නට විය. තාක්ෂණයේ දියුණුවත් සමගම කාන්තාවන්ගේ මෙකී ලාලිත්‍ය ජනප්‍රිය සංස්කෘතිකාංගයන්ගෙන් තව තවත් පෝෂණය වන්නට විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වත්මන් වෙළඳ දැන්වීම් තුළ කාන්තාවන් ප්‍රබල භූමිකාවක් රඟ දක්වයි. අද වන විට කාන්තාවක් නොමැති වෙළඳ දැන්වීමක් දක්නට නොමැති තරම්ය. ඒ අනුව වත්මන් සමාජයේ ගසට පොත්ත පොතට ගස මෙන් කාන්තාව හා වෙළඳ දැන්වීම් බැඳී පවතී. කණගාටුවට කරුණක් වන්නේ වත්මන් වෙළඳ දැන්වීම් තුළ කාන්තාව ලිංගික භාණ්ඩයක් වශයෙන් නිරූපණය කිරීමයි. එහිදි කාන්තාව යොදා නොගත යුතු වෙළඳ දැන්වීම්වල පවා කාන්තාවන් යොදා ගනිමින් ඔවුන්ගේ ලිංගිකත්වය අනවශ්‍ය පරිදි සමාජය ඉදිරියේ විදහා දක්වමින් වෙළෙඳ භාණ්ඩ කෙරෙහි පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කරන්නේ සමස්ත කාන්තා සංහතිය

කාලාන්තරයක් තිස්සේ රැකගෙන ආ ගෞරවය කෙලෙසා දමමිනි.

මීට අමතරව තාක්ෂණයේ දියුණුවත් සමග කාන්තාව විවිධ ක්ෂේත්‍රයන්හි නියැළීම හේතුකොටගෙන ඇතිවූ සෘණාත්මක බලපෑම් කිහිපයක් පහත පරිදි හඳුනා ගත හැකිය.

- විවාහ ජීවිතයට බලපෑම් එල්ල වීම.
- අධික කාර්යබහුලත්වය හේතුකොටගෙන පවුල් සබඳතා දුරස්ථ වීම.
- දරුවන් කෙරෙහි අවධානය අඩුවීම හේතුකොටගෙන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කඩාකප්පල් වීම හා දරුවන් විවිධ අපයෝජනයන්ට ලක්වීම.
- කාන්තාවන් වින්දිතභාවයට පත්වීම
- කාන්තාව සමාජයේ අගෞරවයට, විවේචනයට ලක්වීම.
- කාන්තාවන් ලිංගික අතවරයන්ට ලක්වීම.
- අන්තර්ජාලය පරිහරණය කිරීම තුළින් විවිධ ඇබ්බැහිවීම්වලට ලක්වීම.

ආදී සෘණාත්මක බලපෑම් කාන්තාවන් කෙරෙහි ඇති කරන ආකාරය හඳුනාගත හැකිය.

**ආර්ථිකය තුළ ස්ත්‍රීපුරුෂ සමාජභාවය**

අතීත සමාජයේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙහිලා කාන්තා දායකත්වයක් නොවීය. ඊට හේතු වූයේ ඒ සඳහා පවුල් සංස්ථාව තුළින් මෙන්ම සමාජය තුළින් ද ඉඩ අවකාශය ඔවුන්ට හිමි නොවීමයි. ප්‍රථම වරට ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය සිදුවූයේ දෙවන ලෝක යුද්ධ සංග්‍රාමය තුළය. ලෝක යුධ අවධියේදී යුධ කටයුතු සඳහා ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නියැලුණු පිරිමි පාර්ශවයට යොමු වීමට සිදු විය. මෙම පසුබිම තුළ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ රැකියා පුරප්පාඩු නිර්මාණය විය. මෙකී පුරප්පාඩු වූ රැකියා සඳහා කාන්තා පාර්ශවය යොමුකරවා ගැනීමට යුරෝපීය සමාජයේ ව්‍යාපාරිකයන් කටයුතු කරන්නට වූ අතර මෙය ව්‍යාපාරික ලෝකය තුළ කාන්තා නියෝජනයේ ආරම්භක සන්ධිස්ථානය සනිටුහන් කරන්නක් විය.

වර්තමාන ලෝක ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 47.7%කි. 1997 - 2007 අතර කාලය තුළ කාන්තාවන් මිලියන 200ක් අලුතින් ශ්‍රම වෙළඳපොලට එක්වූ අතර මෙම වර්ධනය රැකියා වනිතාකරණය යන සංකල්පය ජීවමාන කිරීමට සමත් වන්නක් විය. වත්මන් ගෝලීය සන්දර්භය සලකා බලන කළ කාන්තාවන් වැඩි වශයෙන් රැකියා සඳහා යොමු වෙති. විශේෂයෙන්ම ඔවුන් ඇඟලුම් සහ අනෙකුත් කර්මාන්ත ආශ්‍රිත රැකියා කෙරෙහි යොමු වීමට වැඩි නැඹුරුවක් දක්වති. විශේෂයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා සමාජ සජීවීකාරකයන් කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කාන්තා නියෝජනය වැඩිවිය. එසේම "කාන්තා ශ්‍රම බලකාය සවිබල ගැන්වීම" මැයෙන් 2019දී ඇමරිකානු වාණිජ මණ්ඩලයේ පැවති සාකච්ඡාවේදී දක්වනුයේ දුගී බව අඩු කිරීම හා ආර්ථික වර්ධනය දිරිගැන්වීමේ එක් ගාමක බලවේගයක් ලෙසින් සැලකිය හැක්කේ කාන්තාවන් ආර්ථිකය අතින් ශක්තිමත් කිරීම බවයි. කෙසේ නමුත් අදවන විටත් රැකියා ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කොටගත් විභේදනයන් දක්නට ලැබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය පෙන්වා දෙන්නේ ලෝකයේ වැඩ කොටසින් තුනෙන් දෙකකට වඩා වැඩි කොටසක් කාන්තාවන් විසින් සිදු කරන බවයි. දවසේ පැය 24න් පැය 17කට වඩා කාන්තාවෝ වැඩෙහි නියැලෙයි. නමුත් සමස්ත දේපළ වලින් කාන්තාවන්ට හිමි වන්නේ දහයෙන් එකක් වැනි සුළු ප්‍රමාණයක් බවත් එම සංවිධානය වැඩිදුරටත් පෙන්වා දෙයි. සාමාන්‍යයෙන් ලොව පුරා කාන්තාවන් දිනකට පැය හතරයි මිනිත්තු විසිදෙකක් නොගෙවූ ශ්‍රමයෙහි නියැලෙන බවට තොරතුරු හමුවේ. ඒ අතර ලොව පුරා සංවිධාන රාශියක් පර්යේෂණයට කළ මර්සර් විසින් විවිධ අංශවල නියැලෙන කාන්තා නියෝජනය ප්‍රතිශතාත්මකව දක්වා ඇත.

- විධායක ශ්‍රේණිය - 23%
- ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් - 29%
- කළමනාකරුවන් - 37%
- වෘත්තිකයන් - 42%
- සහාය කාර්ය මණ්ඩලය - 47% (catalyst.org, 2021)

මීට අමතරව වත්මන් ලෝකයේ කාන්තා ව්‍යවසායකයින් කැපී පෙනෙන ලෙස ඉස්මතු වෙමින් පවතී. දැනට ලොව පුරා ව්‍යාපාර වලින් 38%ක අයිතිය කාන්තාවන් සතුය. එබැවින් බොහෝ රටවල් කාන්තා ව්‍යවසායකයින් බිහි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කරමින් පවතී. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ව්‍යවසායකත්ව පුහුණුව, ශිල්පීය පුහුණු වැඩසටහන්, ගිණුම් පුහුණු වැඩසටහන්, චක්‍රීය ණය වැඩසටහන්, වනිතා ශක්ති බැංකු පදනම, ගෙවතු වගා වැඩසටහන් යනාදී වැඩසටහන් දියත් කරයි. එසේම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල රට තුළට විදේශ සංචිත ගෙන ඒමේ ප්‍රමුඛයින් වශයෙන් කටයුතු කරන්නේ

කාන්තාවන්ය. විදේශීය රටවල විවිධ අංශයන්හි නියැලෙන ලාංකීය කාන්තාවන්ගේ සේවා නියුක්තිය මහ බැංකු වාර්තාව තුළින් පෙන්වා දී ඇත. එය පහත පරිදි වේ.

| | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| වෘත්තිය මධ්‍යම හා ලිපිකරු රැකියා | 1960 | 1.53% | 1964 | 1.50% | 2012 | 1.58% |
| පුහුණු රැකියා | 5380 | 4.21% | 6417 | 4.91% | 6582 | 5.18% |
| අර්ධ පුහුණු රැකියා | 361 | 0.28% | 562 | 0.43% | 440 | 0.35% |
| නුපුහුණු රැකියා | 6366 | 4.98% | 8962 | 6.86% | 10240 | 8.06% |
| ගෘහ සේවය | 113678 | 88.99% | 112752 | 86.30% | 107816 | 84.8% |
| එකතුව | 127745 | 100.00% | 130657 | 100.00% | 127090 | 100.00% |

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2012 - ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ නමුත් ආර්ථිකය ශක්තිමත් කිරීමෙහිලා කාන්තාවන් කෙතරම් දායකත්වයක් දැක්වුවද ඒ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ක්‍රියාත්මක වන බවත් ඒ තුළ කාන්තාවන් විවිධ අසාධාරණකම්වලට ලක් වන බවත් හඳුනාගත හැකිය. උදාහරණයක් වශයෙන් ලංකාවේ නියෝජ්‍ය පොලිස්පති තනතුරට බිම්ශානි ජාසිංආරච්චි නම් වූ කාන්තාවක් පත් වූ අතර එම පත්වීම අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරූ අතර අවසානයේදී එම තනතුර මාස හයකට සීමා වෙමින් එම තනතුරෙන් ඉවත් වීමට ඇයට සිදුවිය.

කෙසේ වෙතත් අතීතයේ නිවසෙහි දරුවන් හා ස්වාමියාගේ කටයුතු කරමින් සිටි කාන්තාව මේ වන විට තම ආර්ථිකය ගොඩ නංවාගනු පිණිස රැකියාවල නිරත වීම නිසා වර්තමාන ගෝලීය ආර්ථිකය තුළ කාන්තාව වැදගත් ස්ථානයක් හිමි කරගෙන ඇති බව හඳුනා ගත හැකිය.

**අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය**

පැරණි සමාජයේ කාන්තාවට උරුම වූයේ නිවසේ වැඩ කටයුතු කිරීම පිළිබඳ ඉගෙන ගැනීම පමණි. නමුත් තාක්ෂණයේ දියුණුවත් සමගම අධ්‍යාපන හිමිකම කාන්තාවටද උරුම විය. කාන්තාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට නම් අධ්‍යාපනය අත්‍යවශ්‍ය වේ. කාන්තාවන් අඩු අධ්‍යාපනයෙන් යුක්ත වීම මත අඩු වයසින් විවාහ වීම, මාතෘ මරණ ඉහළ යාම, ළමා මරණ අනුපාතය ඉහළ යාම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, දික්කසාද ඉහළ යාම ආදී තත්ත්වයන් දැකගත හැකිය. මෙම තත්ත්වය හේතුකොටගෙන 2014දී ලෝක බැංකුව කාන්තාවන්ගේ ආර්ථික හා සමස්ත සවිබලගැන්වීම කෙරෙහි අධ්‍යාපනයෙහි ඇති වැදගත්කම පෙන්වා දී ඇත.

වර්තමාන ලෝකයේ හඳුනාගත හැකි නව ප්‍රවණතාවයක් වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පිරිමින්ට සාපේක්ෂව වැඩි කාන්තා නියෝජනයක් දක්නට ලැබීමයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්කල ප්‍රාථමික මෙන්ම ද්විතීක අධ්‍යාපනයේ නියැලෙන කාන්තා ප්‍රතිශතය පිරිමින්ට සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් ගනී. එපමණක් නොව උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වන සමස්ත ප්‍රතිශතයෙන් 70% ඉක්මවූ ප්‍රතිශතයක් සිටින්නේ කාන්තාවන්ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් වැඩි වශයෙන් දැකගත හැකිය. සමස්තයක් ලෙස 2005-2020 දක්වා වූ කාලය තුළ ගෝලීය වශයෙන් උපාධිධාරී කාන්තා ප්‍රතිශතය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

| රට | 2005 | 2015 | 2020 |
|---|---|---|---|
| ඔස්ට්‍රේලියාව | 56% | 62% | 62% |
| චෙච් ජනරජය | 57% | 55% | 61% |
| ඩෙන්මාර්කය | 59% | 66% | 68% |
| ප්‍රංශය | 56% | 65% | 66% |
| ජර්මනිය | 53% | 65% | 61% |
| හංගේරියාව | 64% | 66% | 73% |
| ඉතාලිය | 59% | 68% | 70% |
| ජපානය | 49% | 49% | 54% |
| කොරියාව | 49% | 54% | 56% |
| පෝලන්තය | 66% | 63% | 62% |
| ස්විස්ටර්ලන්තය | 43% | 49% | 48% |
| තුර්කිය | 44% | 35% | 37% |
| එක්සත් රාජධානිය | 58% | 72% | 72% |
| එක්සත් ජනපදය | 58% | 61% | 57% |
| ස්වීඩනය | 63% | 74% | 76% |

(හේරත්, 2013).

මෙලෙස කාන්තාව අධ්‍යාපනය තුළ ස්ථාවර කිරීම ඔවුන්ගේ අභිවෘද්ධිය සලසාලීම පමණක් නොව රටක අනාගතය, මතු පරපුර වෙනුවෙන් කෙරෙන අගනා ආයෝජනයකි. අදවන විට මැතක් වන තුරුම අධ්‍යාපන හිමිකම අහෝසි කර දමා තිබූ මුස්ලිම් කාන්තාවන්ට පවා අධ්‍යාපන අයිතිය හිමි වී තිබීම සතුටට කාරණයකි. මේ ආකාරයට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අඛණ්ඩ අධ්‍යාපනයේ නියැලීම හේතුකොටගෙන සාක්ෂරතා ප්‍රතිශතය ද බොහෝ රටවල 90% ඉක්මවූ ප්‍රමාණයක් දක්නට ලැබේ. මේ ආකාරයේ වූ සාධනීය තත්ත්වයක් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් සම්බන්ධයෙන් දැකගත හැකි වේ.

**දේශපාලනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය**

පැරණි සමාජයේ දේශපාලන අධිකාරීත්වය හිමිවූයේ පුරුෂ පාර්ශවයට පමණි. දේශපාලන පක්ෂ පිහිටුවීම, ඡන්දය දීම, මැතිවරණ සඳහා ඉදිරිපත් වීම මෙන්ම දේශපාලන මතිමතාන්තර දැරීමේ අයිතිය එදා පිරිමින්ට පමණක් හිමි විය. නමුත් පසු කාලීනව දේශපාලන අයිතිය කාන්තාවන්ට ද හිමි විය. වසර 2500කට වැඩි ශ්‍රී ලංකා ඉතිහාසය තුළ රාජ්‍යත්වයට පත් වී ඇත්තේ කාන්තාවයන් සිව් දෙනෙකු පමණි. ඒ අනුලාදේවි, සීවලී, ලීලාවතී හා කල්‍යාණී යන රැජිනියන් වන අතර ඔවුන් බලයේ සිටියේ කෙටි කාල සීමාවක් සඳහා පමණක් වන අතර එයද කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් භුක්ති විඳීමක් ලෙස නොව කිසියම් සුවිශේෂී තත්ත්වයක් තුළ හෝ අහම්බෙන් ලැබුණු අවස්ථා ලෙසිනි (පෙරේරා, 2017). නමුත් ලංකාව තුළ සිදු වූ ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් වශයෙන් සර්වජන ඡන්ද බලය හරහා ඡන්ද අයිතිය කාන්තාවට ද හිමි විය. නමුත් කාන්තාවන් සඳහා ඡන්ද බල නියෝජනයක් හිමි වුවත් සැලකිය යුතු දේශපාලන නියෝජයක් වර්තමානය වන විටත් කාන්තාවන් සම්බන්ධයෙන් නොපවතී. ක්‍රිස්ටින් පින්ටැට් ලොව පුරා රටවල් 179ක කාන්තාවගේ සක්‍රීය දේශපාලන සහභාගීත්වය පිළිබඳව කරන ලද පර්යේෂණයෙන් අනුව ප්‍රකාශ කොට ඇත්තේ " දේශපාලනය යනු පිරිමින් පමණක් නිරතවන පාපන්දු පිටියක් වැනිය" යනුවෙනි (පෙරේරා, 2017).

අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් රටවල් 189ක් ඇසුරින් කරන ලද අධ්‍යයනයකට අනුව සමස්ත ලෝකයේම ව්‍යවස්ථාදායක යන්හි කාන්තා නියෝජනය 2012 වන විට 19.6%ක් බව පෙන්වා දී ඇත (ලියනගේ, 2012). 2016 ජුනි 01 දින වනවිට ලෝකයේ විවිධ රටවල ව්‍යවස්ථාදායකය තුළ කාන්තා දේශපාලන නියෝජනය පහත පරිදි වේ.

| තත්ත්වය | රට | මැතිවරණය | ආසන ගණන | කාන්තා නියෝජනය | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 1 | රුවන්ඩාව | 2013 | 80 | 51 | 63.8% |
| 2 | බොලිවියාව | 2013 | 130 | 69 | 53.1% |
| 3 | කියුබාව | 2014 | 612 | 299 | 48.9% |
| 4 | සීසෙල්ස් | 2011 | 32 | 14 | 43.8% |
| 5 | ස්වීඩනය | 2014 | 349 | 152 | 43.6% |
| 6 | සෙනෙගල් | 2012 | 150 | 64 | 42.7% |
| 7 | මෙක්සිකෝ | 2015 | 500 | 212 | 42.4% |
| 10 | පින්ලන්තය | 2015 | 200 | 83 | 41.5% |
| 11 | නැමිබියාව | 2014 | 104 | 43 | 41.3% |
| 15 | නොර්වේ | 2013 | 109 | 67 | 39.6% |
| 19 | ඉතියෝපියා | 2015 | 547 | 212 | 38.8% |
| 26 | ජර්මනිය | 2013 | 631 | 230 | 36.5% |
| 47 | නේපාලය | 2013 | 595 | 176 | 29.6% |
| 48 | එක්සත් රාජධානිය | 2015 | 650 | 191 | 29.4% |
| 56 | ඊශ්‍රයලය | 2015 | 120 | 32 | 26.7% |
| 68 | ඉරාකය | 2014 | 328 | 87 | 26.5% |
| 83 | පකිස්ථානය | 2013 | 340 | 70 | 20.6% |
| 87 | බංග්ලාදේශය | 2014 | 350 | 70 | 20.0% |
| 91 | සව්දි අරාබිය | 2013 | 151 | 30 | 19.9% |
| 96 | ඇමරිකා එක්සත් ජනපදය | 2014 | 434 | 84 | 19.4% |
| 132 | රුසියාව | 2011 | 450 | 61 | 13.6% |
| 141 | ඉන්දියාව | 2014 | 543 | 65 | 12.0% |
| 175 | ශ්‍රී ලංකාව | 2015 | 225 | 13 | 5.8% |

(Inter- Parliamentary Union on the basis of information provided by National Parliaments by 1st,2016).

මේ තුළින් පැහැදිලි වන්නේ ලෝකයේ වැඩිම කාන්තා දේශපාලන නියෝජනයක් පවතින්නේ ඉතාම දිළිඳු රාජ්‍යක් ලෙස සැලෙකෙන රුවන්ඩාවේ බවයි. එසේම දකුණු ආසියාතික කලාපයේ සාක්ෂරතාවය බෙහෙවින්ම අඩු නේපාලය, පකිස්ථානය, බංග්ලාදේශය, ඉන්දියාව වැනි රටවල්ද ලංකාවට වඩා වැඩි කාන්තා දේශපාලන නියෝජනයක් පවතී. මේ ආකාරයට දේශපාලනය තුළ කාන්තා නියෝජනය අඩු වීම කෙරෙහි විවිධ සාධක බලපෑම් කරන බව හඳුනා ගත හැකිය.

- මැතිවරණ සඳහා නාමයෝජනා ලබා දීමේදී පිරිමි අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවය ලබා දීම.
- කාන්තාවන්ට ගෘහය තුළ පවතින අසීමාන්තික වගකීම් මත දේශපාලන වගකීම් දැරීමට කාලයක් නොවීම.
- ඉහළ තත්ත්වයන් දැරීමට තමන්ට ඇති සුදුසුකම් පිළිබඳ ඇති අවිශ්වාසය හා තමන්ගේ හැකියාව පිළිබඳව පවතින අවතක්සේරුව.
- කාන්තාවන් දේශපාලනයට යොමු වීම සම්බන්ධයෙන් සමාජය තුළ පවත්නා ඍණාත්මක ආකල්ප.

යම් කාන්තා නියෝජනයක් ඉදිරියට එමින් පවතී. නමුත් කණගාටුවට කරුණක් වන්නේ දේශපාලනය තුළ කාන්තාවන්ට බලය ලබා දීමට බොහෝ පිරිස් අකමැති වීමයි. 2021 වසරේදී රටවල් 22ක කාන්තා දේශපාලන නායකත්වය දැකිය හැකිය. කාන්තා දේශපාලන නායකත්වය විමසා බැලීමේදී ශ්‍රී ලංකාවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ ලෝකයේ ප්‍රථම අගමැතිනිය ශ්‍රී ලංකාවෙන් පත්වීමයි. ඇය නමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. එසේම බ්‍රිතාන්‍යයේ රාජ්‍ය නායකයා වශයෙන් පාරම්පරිකව රැජිනක් නායකත්වය දරයි. එසේම පසුගිය මැතිවරණ

සමයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ පළමු උප ජනාධිපතිනිය වශයෙන් කමලා හැරිස් මහත්මිය පත්විය.

මේ ආකාරයට දේශපාලන මතිමතාන්තර දැරීමට පවා අයිතිය අහිමි වූ කාන්තා ප්‍රජාවට මෙයාකාර වූ ඉහළ දේශපාලන නියෝජනයක් හිමිවීම දේශපාලනය තුළ කාන්තා නියෝජනයේ සිදුවූ වෙනස්වීමක් ලෙස හඳුනා ගත හැකිය.

**සමාජ හා සංස්කෘතිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය**

අතීත සමාජයේ පුරුෂාධිපත්‍යයට යටත්ව සීමා මායිම් තුළ ස්වාධීනත්වය හා නිදහස් චින්තනය අහිමිව නිවසට සීමා වූ කටුක නිරස ජීවිතයක් ගත කිරීමට කාන්තාවට සිදු විය. නමුත් වර්තමානයේ එකී සීමා මායිම් බිඳ හෙළමින් ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, පරිපාලන, සෞඛ්‍ය, ක්‍රීඩා වැනි ක්ෂේත්‍ර ගණනාවක ඔස්සේ කාන්තාවක්ගේ නැගීම දක්නට ලැබේ. විශේෂයෙන්ම නවීකරණය වූ වත්මන් තාක්ෂණික ලෝකය තුළ සමාජ සංස්කෘතික බාධක බිඳ දමමින් වෙළෙඳ දැන්වීම්, නිවේදනය, ගායනය, නර්තනය, රංගනය, නිරූපණය වැනි අංශයන්ට යොමු වී ඇත.

එපමණක් නොව කාන්තාවන්ට එරෙහි බලවේග පාලනය කිරීමට කාන්තා සමිති, යෞවන සමිති, කාන්තා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවාගෙන ඇත. ඒ තුළින් කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට හා කාන්තා හිංසනයට එරෙහිව නැගී සිටීමට හඬ නගයි. මේ ආකාරයට වත්මන් සමාජයේ කාන්තාවන් ක්‍රියාකාරී සමාජ කොට්ඨාශයක් වශයෙන් හඳුනාගත හැකිය. එමෙන්ම පුරුෂයන්ට නොදෙවෙනි ආකාරයේ මනා පෞරුෂයකින් යුත් කාන්තාවෝ ලොව පුරා දැකගත හැකිවේ.

**සමාලෝචනය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ කාන්තාවගේ භූමිකාව ගත්විට සමස්ත සමාජය තුළ පුරුෂයා හා සම තත්ත්වයක් ඇත අතීතයේ සිට අද දක්වාම දක්වාම පැවතී නැති බව හඳුනාගත හැකිය. නමුත් අතීතයේ පැවති තත්වයට සාපේක්ෂව වත්මන් සමාජය තුළ කාන්තාවට යම් ඉහළ සමාජ තත්වයක් හිමි වී තිබෙන බව හඳුනාගත හැකිය. නමුත් කාන්තාවට කිසිලෙසක පුරුෂ පාර්ශවය ඉක්මවා යාමේ බලයක් සමාජය විසින් සලසා නොමැත. ආර්ථික හැකියාව සහ විශේෂයෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාපන යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සලකා බැලීමේදී කාන්තාවන් හා පුරුෂයන් අතර අතීතයේ පැවති විෂමතාව ගෙවී ගිය වසර කිහිපය තුළදී යම් මට්ටමකින් අඩු වී ඇතත් එකී තත්ත්වය පූර්ණ වශයෙන් පහව යාමට තවත් ශතවර්ෂ ගණනාවක් ගතවනු ඇත.

විශේෂයෙන්ම වත්මන් සමාජයේ කාන්තාවට අධ්‍යාපන ක්ෂේත්‍රය, රැකියා ක්ෂේත්‍රය, දේශපාලන යනාදී ක්ෂේත්‍රන් තුළ කටයුතු කිරීමට අවස්ථාව හිමි වුවද ඒ තුළ කාන්තාවන් විවිධාකාරයෙන් වින්දිතභාවයට පත්වන බව හඳුනාගත හැකිය. විශේෂයෙන්ම රැකියා ක්ෂේත්‍රය ගත්විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මතම වෙනස්වීම්වලට මෙන්ම නොසලකාහැරීම්වලට ලක් වන ආකාරය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම වැටුප සම්බන්ධයෙන් ගත් විට එකම සේවය සිදු කළද ස්ත්‍රිය හා පුරුෂයාට හිමිවන්නේ දෙයාකාරයක වටිනාකමකි. උදාහරණයක් වශයෙන් කුලී වැඩෙහි නියැලෙන පුරුෂයාට ඉහළ වැටුපකුත් එකී ක්‍රියාවේම නියැලෙන කාන්තාවට ඊට සාපේක්ෂව අඩු වැටුපකුත් හිමිවන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තළ කාන්තාවගේ තත්ත්වය පහළට ඇද දමමිනි. නමුත් අදවන විට මෙම තත්වය ක්‍රම ක්‍රමයෙන් වියැකී යනු දක්නට ලැබෙන්නේ සාම්ප්‍රදායික මතිමතාන්තර වියැකී ගොස් නව ආකල්ප දරන පුද්ගල කොට්ඨාශයක් බිහිවීම හේතුකොටගෙනය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


පෙරේරා, ආර්. (2017). *කාන්තාව හා දේශපාලන සහභාගිත්වය. Governance*, 155.

ලියනගේ, කේ. (2012). *ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජනය සමානද?*. 947, පේරාදෙණිය පාර, මහනුවර: ෆ්‍රෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන්.

ලියනගේ, කේ., & වලාකුළුගේ, එස්. (2006). *ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය*. අංක 4, ඇඩ්මිස් පටුමග, කොළඹ 4, ශ්‍රී ලංකාව: ෆ්‍රෙඩ්රික් ඊබන් පදනම.

හේරත්, වී. (2013). *කාන්තාව සහ සංවර්ධනයග* රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 58: ශ්‍රී ලංකා මහ බැංකුව.

*Catalyst.org*. (2021, february 11). Retrieved july 08, 2022, from women in the Workforce: https://www.catalyst.org/research/women-in-the-workforce-global/